**වරකාපොල ප්‍රාදේශීය සභාව**
**<u>කෑගල්ල දිස්ත්‍රික්කය</u>**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කල මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වරකාපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ණය හිමියෝ රු. 35,293 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු. 4,090,049 ක් වුවත් එය රු.8,209,974 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වැටුප් ප්‍රතිපූරණ රු. 4,119,925 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
--------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 22 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.108,383,460 ක් වූ නමුත්, ඊට අදාළ උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.93,342,013 ක් වූයෙන් රු.1,504,144 ක වෙනසක් විය.

(ආ) ස්ථාවර වත්කම් ගිණුම් ශේෂය රු. 164,687,362 ක් වූ නමුත් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු. 125,004,008 ක් වූයෙන් රු. 39,683,354 ක වෙනසක් විය.

(ඇ) දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුමේ ශේෂය රු. 9,525,086 ක් වූ නමුත් ඊට අදාල උපලේඛනයට අනුව ශේෂය රු. 15,526,685 ක් වූයෙන් රු. 6,001,599 ක වෙනසක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ක් ඉක්ම වූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.28,458,790 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්
-----------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ක් ඉක්ම වූ විවිධ ණයහිමි ශේෂ වටිනාකම රු.19,786,415 ක් විය.

1.4 අනුකූල නොවීම්

-------------------

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| **(i)** මු.රෙ. 189 | 15,346 | අගරු චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| **(ii)** මු.රෙ. 396 (ඇ) | 18,591 | නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 67 හා 68 වගන්ති | | සභාව විසින් නිකුත් කරනු ලබන සංවර්ධන බල පත්‍රයේ 02 වගන්තිය ප්‍රකාරව ඉදිකරනු ලබන නව ගොඩනැගිල්ලක් සඳහා අනුකූලතා සහතිකයක් ලබාගැනිමකින් තොරව ප්‍රයෝජනයට ගැනීම සිදු නොකල යුතු වුවත් නියැදි ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව ගොඩනැගිලි 07 ක් අනුකූලතා සහතිකය ලබා ගැනීමෙන් තොරව ප්‍රයෝජනයට ගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 33,905,666 වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 23,527,420 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,160,000 | 8,160,000 | 7,399,111 | 760,888 | 7,638,000 | 7,638,000 | 6,834,879 | 803,120 |
| (ii) | කුලී | 7,527,000 | 7,527,000 | 5,694,064 | 1,832,935 | 7,354,000 | 7,354,000 | 6,569,752 | 784,247 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,420,200 | 1,420,200 | 1,388,938 | 31,262 | 1,520,300 | 1,520,300 | 1,527,293 | (6,993) |
| (iv) | වෙනත් ආදායම් | 86,479,500 | 86,479,500 | 52,097,784 | 34,381,715 | 78,073,700 | 78,073,700 | 51,954,268 | 26,119,431 |

2.2.2 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 05 කට වරක් දේපල තක්සේරු කර බදු මුදල් අයකල යුතු වුවත් 2008 වර්ෂයෙන් පසු වරිපනම් දේපල තක්සේරු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා සීමාව තුල නව සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන මූලික තක්සේරු කටයුතු සිදුකර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලන රීති 33 ප්‍රකාරව ගෙවීම් පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් හා දේපල තහනම් කිරීමේ වරෙන්තුවක් එක් එක් කාර්තුව අවසානයේ පිළියෙල කර දේපල තහනම් කිරීමේ නිලධාරියා වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) උප වගන්තිය අනුව දේපල තහනමට යොමුවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 බලපත්‍ර ගාස්තු

සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර ආයතන 9 ක පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.36,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

2.2.4 වෙනත් ආදායම්

(අ) සංචාරක හෝටල් ගාස්තු

සභා බල ප්‍රදේශයට අයත් සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දැන්වීම් පුවරු ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(vii)ඊ හා 126(xxx) හා 1988 අගෝස්තු 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව දැන්වීම් පුවරු ගාස්තු ලෙස රු. 199,230 ක් අයකරගෙන තිබුණද විධිමත් පරිදි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විනෝද බදු

සිනමාශාලා දෙකකින් 2014 වර්ෂයේ සිට ලැබිය යුතු රු. 179,089 ක විනෝද බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රථවාහන නැවතුම්පල ගාස්තු

රථවාහන නැවතුම්පල ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද සමාලෝචිත වර්ෂය තුළ ආදායම් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ඉඩම් කට්ටිකර විකිණීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය අනුව කලටියගොඩ කොස්ගහමුලහේන ඉඩම කට්ටිකර විකිණීම මත සභාවට අයවිය යුතු සියයට 1 ක ගාස්තුව රු.40,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.9,999,633 ක් හා මුද්දර ගාස්තු ආදායම රු.36,902,401 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබාගැනීම

(i) 2017 වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම සඳහා ව්‍යාපෘති 24 ක් යටතේ රු.10,564,000 ක් ඇස්තමේන්තු කර තිබුණද ඉන් වටිනාකම රු.3,850,000 ක් වූ ව්‍යාපෘති 14 ක් ඉටුකර නොතිබුණි.

(ii) 2016 වර්ෂයේ අරමුදල් ප්‍රභවයන් 03 ක් යටතේ කර්මාන්ත 54 ක් සඳහා රු.12,109,098 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2018 අප්‍රේල් වනවිටත් එම කර්මාන්ත ඉටුකර නොතිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

තෙලිඇල්ල කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත විධිමත් පරිදි කසළ බැහැර නොකිරීම නිසා මහජන විරෝධතා ඇති වී තිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
--------------------------------------
සරප් ලැබීම පිළිබඳ දෛනික සටහන් පොත දෛනිකව සරප් විසින් තුලනය කර නොතිබුණු අතර දෛනික මුදල් ශේෂය හා පොත් ශේෂය දෛනිකව අධීක්ෂණ නිලධාරියෙකු විසින් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රිති 164 අනුව පරීක්ෂා කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
--------------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ අතිරික්ත සේවක සංඛ්‍යාව 20 වූ අතර ඊට අමතරව ශ්‍රම පදනම හා අනියම් පදනම මත බඳවාගත් සේවකයන් 29 ක් විය. දින 180 සම්පූර්ණ විමේදී ස්ථිර කිරීම සඳහා පූරජපාඩු නොමැති වූ අතර බඳවා ගැනිමේ අවම සුදුසුකම් සපුරා නොමැති සේවකයන් 14 දෙනෙකුගේ ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) දීර්ඝ කාලයක සිට ස්ථාන මාරු වී ගිය, සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා තොරතුරු සොයාගත නොහැකි ලෙස සඳහන් වූ වටිනාකමරු. 148,069 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------
සබරගමුව පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2005 ජුනි 01 දිනැති අංක 2005/04 දරන චක්‍ර ලේඛයේ (vi) ඡේදය ප්‍රකාරව කලටියගොඩ කොස්ගහමුල හේන ඉඩම කට්ටි කිරීම මත සභාවට හිමිවිය යුතු පර්චස් 45 ක භූමි ප්‍රමාණය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. චක්‍රලේඛයේ (iv) ඡේදය ප්‍රකාරව ඉඩම් විකුණුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණු අතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් ඉඩම් විකිණීමට අදළ ඔප්පු, අංක හා වටිනාකම් ලබාගෙන විකුණුම්කරු විසින් සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂාකර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය
------------------------------
වරකාපොල ප්‍රාදේශීය සභාව සතුව පොදු සුසාන භූමි 85 ක් අනාවරණය වූ අතර එම සුසාන භූමි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර පවරා ගැනීමට, මැනුම් කිරීමට, ආරක්ෂිත වැටවල් ඉදිකර අයිතිය තහවුරු කරගැනීමට හා ආදායම ලැබෙන පරිදි එළදාව බඳුදීමට කටයුතු කර නොතිබුණි.

3.6 හානි හා පාඩු
------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය අනුව වටිනාකම රු. 38,076 ක් වූ භාණ්ඩ ඌනතාවය සම්බන්ධව සිදුවූ පාඩුව පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අල්ගම මහජන පුස්තකාලයේ වර්ෂ ගණනාවක සිට ඉදිරියට එන හිඟ පොත් ලැයිස්තුව අදාළ පුද්ගලයාගෙන් අයකර ගැනීමට හෝ පරිග්‍රහන ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

4.1 අයවැය පාලනය
------------------
සමාලෝචිත වර්ෂය සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් වැය විෂයන් 46 ක එකතුව රු. 7,167,000 ක ප්‍රතිපාදන සියයට 100 ක් හා වැය විෂයන් 52 ක එකතුව රු. 9,710,962 ක ප්‍රතිපාදන වලින් සියයට 40 ත් සියයට 98 ක් අතර ද වශයෙන් එකතුව රු. 16,877,962 ක් සභා කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| | | (ii) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් නොකිරීම |
| | | (iii) | ආදායම් , වියදම් හා වත්කම්, බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කිරීම |
| | | (iv) | ලෙජර් ගිණුම් ශේෂ හා ලේඛන නොසැසඳීම |
| (ආ) | අයවැය පාලනය | | ශුද්ධ ප්‍රතිපාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක ඉතිරිවීම් තිබීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | (i) | වරිපනම් දේපොල නියමිත පරිදි තක්සේරු නොකිරීම |
| | | (ii) | උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් අයකර නොගැනීම |
| | | (iii) | නව ඉදිකිරීම් මත වරිපනම් බදු අය නොකිරීම |
| (ඇ) | වත්කම් පාලනය හා ආරක්ෂාව | | සභාව සතු සුසාන භූමිවල අයිතිය හා ආරක්ෂාව පිළිබඳ කටයුතු නොකිරීම. |